ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව.
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: **dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය: **www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| **නිකුත් කළේ** | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| **දිනය** | 2019 අගෝස්තු 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2019 ජූලි


**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**55.7**

**2019 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.8 ක ඉහළ යාමකි.**

2019 ජූලි මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම් තවදුරටත් වැඩි වේගයකින් වර්ධනය විය. ඒ අනුව, 2019 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 1.8 කින් ඉහළ යමින් 2019 ජූලි මාසයේ දර්ශක අගය 55.7 ක් ලෙස වාර්තා කරන ලදී. විශේෂයෙන්ම ආහාර හා පාන වර්ග නිෂ්පාදන අංශයෙහි නව ඇණවුම් වල සිදුවූ සැලකියයුතු ඉහළ යෑම හේතුවෙන් නිෂ්පාදන ක්‍රියාකාරකම්හි සිදුවූ ඉහළ යාම ද, නිෂ්පාදන අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයේ මෙම වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු බාධා පැමිණ තිබූ ආර්ථික ක්‍රියාකාරකම් නැවත යථා තත්වයට පත්වීම, නව ඇණවුම් ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රෙදිපිළි හා ඇඟළුම් නිෂ්පාදන අංශයෙහි බොහෝමයක් ප්‍රතිචාර දක්වන්නන් ඉස්මතු කළ පරිදි එම අංශයෙහි සේවකයින් සේවය හැර යෑම් ඉහළ මට්ටමක පැවතියද, සේවා නියුක්ති උප දර්ශකය අඩු වේගයකින් වර්ධනය විය.

නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| **ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | 53.9 | 55.7 | + | **වැඩි වේගයකින් ඉහළ යෑමක්** |
| | | **උප දර්ශක** | | |
| නව ඇණවුම් | 53.0 | 59.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| නිෂ්පාදන | 56.5 | 57.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 55.5 | 52.0 | - | අඩු වේගයකින් ඉහළ යෑමක් |
| ගැනුම් තොගය | 51.5 | 57.0 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.0 | 50.0 | - | ඉහළ යෑමක සිට නොවෙනස් මට්ටමට ලඟා වීමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

නව ඇණවුම් සහ නිෂ්පාදන ක්‍රියාකාරකම් වල සිදුවූ වර්ධනය මෙන්ම එළඹෙන උත්සව සමයේ ඉල්ලුම මෙන්ම, එළඹෙන මැතිවරණ කාල සීමාව තුළ සිදුවිය හැකි බාධාවන්ට මුහුණ දීම සඳහා පූර්ව සූදානමක් ලෙස අමුද්‍රව්‍ය තොග රැස් කිරීමට නිෂ්පාදකයින් පෙළඹීමත් ගැණුම් තොගයෙහි සැලකිය යුතු ඉහළ යාම කෙරෙහි හේතුවක් විය. තවද, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතීම කෙරෙහි, පාස්කු ඉරිදා දින සිදුවූ ප්‍රහාරයෙන් පසු තර කරන ලද ආරක්ෂක විධිවිධාන ක්‍රමයෙන් ලිහිල් කිරීම ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

සලකනු ලැබූ කාල සීමාවේදී ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයෙහි නොවෙනස් මට්ටමට ලඟා වූ, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය උප දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක, කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා වැඩි අගයක් වාර්තා කරන ලදී.

### ගෝලීය ප්‍රවණතා: නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය

ගෝලීය ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 0.1 කින් පහළ යමින් 2019 ජූලි මාසයේදී 49.3 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී.

2019 ජූලි මාසයේදී, එක්සත් ජනපදය සහ යුරෝපා කලාපය නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වුවත් රුසියාව, චීනය, ඉන්දියාව සහ සිංගප්පූරුව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකයන්හි වර්ධනයක් පෙන්නුම් කළ අතර එක්සත් රාජධානිය නොවෙනස්ව පැවතුණි.

*මූලාශ්‍රය: මාකිට් [1] ආයතනය, 2019 අගෝස්තු 15 වන දිනට*

[1] මාකිට් යනු ලොව ප්‍රධාන පෙළේ මූල්‍ය තොරතුරු සේවා ලබාදෙන ආයතනයකි. මෙය ජාත්‍යන්තරව ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරන ප්‍රධාන ආයතනයක් වන අතර, එමඟින් යුරෝපා කලාපය ඇතුලුව රටවල් *30* කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

2019 ජූලි මාසයේ දී සේවා අංශය අඛණ්ඩව වර්ධනය වූ අතර, 2019 ජූනි මාසයට සාපේක්ෂව නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ අපේක්ෂිත ක්‍රියාකාරකම් වැඩි වේගයකින් වර්ධනය වීම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුබෑමකට ලක්ව යථා තත්ත්වයට පත්වෙමින් පැවති සේවා අංශය තවදුරටත් යථා තත්ත්වයට පත්වීමක් මෙමගින් පෙන්නුම් කෙරේ.

තොග සහ සිල්ලර වෙළඳාම; නවාතැන් සහ ආහාරපාන සැපයීමේ සේවා; මූල්‍ය සේවා සහ ප්‍රවාහන යන උප අංශවල ව්‍යාපාර ක්‍රියාකාරකම් 2019 ජූලි මාසයේ දී අඛණ්ඩව දෙවන මාසයටත් වර්ධනය විය. බොහොමයක් උප අංශවල සේවා සපයන්නන්ගේ ඉදිරි මාස 3 සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂා සුබවාදී ආකාරයෙන් වර්ධනය වූ අතර, එය පසුගිය මාස 29 තුළ වාර්තා කළ ඉහළම අගය වාර්තා කරන ලදී. කෙසේ වුවද, පුරප්පාඩු සඳහා නව බඳවා ගැනීම් ප්‍රමාද වීම සහ මෙතෙක් මිනිස් ශ්‍රමය යොදාගත් කාර්යයන් සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කිරීම හේතුවෙන් සේවා නියුක්තිය පසුගිය මාසයට සාපේක්ෂව පහළ යෑමක් වාර්තා කළේය.

| විචල්‍යය | ජූනි | ජූලි | +/- | සාරාංශය |
|---|---|---|---|---|
| ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය | 53.1 | 57.1 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| උප දර්ශක | | | | |
| නව ව්‍යාපාර | 57.4 | 59.9 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| ව්‍යාපාර ක්‍රියාකාරකම් | 57.4 | 63.5 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| සේවා නියුක්තිය | 44.7 | 43.2 | - | වැඩි වේගයකින් පහළ යෑමක් |
| නිමකිරීමට නියමිත කාර්යයන් | 44.1 | 47.7 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් | 61.8 | 71.4 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |
| අනෙකුත් දර්ශක | | | | |
| අයකරන මිල ගණන් | 47.9 | 49.5 | + | අඩු වේගයකින් පහළ යෑමක් |
| අපේක්ෂිත ශ්‍රම පිරිවැය | 63.4 | 66.3 | + | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


තැන්පතු පොලී අනුපාතික පහළ දැමීමට සමගාමීව ණය පොලී අනුපාතික ද (අය කරන මිල ගණන්) පහළ දමන ලද බව මූල්‍ය සේවා උප අංශයෙහි ප්‍රතිචාර දක්වන්නන් සඳහන් කරන ලදී. ඒ අනුව, සමස්තයක් වශයෙන් සේවා අංශයෙහි අය කරන මිල ගණන් පහළ ගියේය. මේ අතර, සාමාන්‍යයෙන් සිදු කෙරෙන වැටුප් වර්ධන හේතුවෙන් අපේක්ෂිත ශ්‍රම පිරිවැය 2019 ජූලි මාසයේ දී වැඩි වේගයකින් ඉහළ යන ලදී.

**ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක අගය**

**57.1**

**2019 ජූනි මාසයට සාපේක්ෂව දර්ශකාංක 4.0 ක ඉහළ යෑමකි.**

සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා: සේවා අංශයෙහි ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය**

ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය සහ ඉතාලිය යන රටවල සේවා අංශයන්හි වර්ධනය ඉහළ යෑම සහ ඉන්දියාව, බ්‍රසීලය සහ රුසියාව යන රටවල සේවා අංශයන්හි පැවති පහළ යෑම, ඉහළ යෑමකට පරිවර්තනය වීම හේතුවෙන්, ගෝලීය සේවා අංශයෙහි නිමැවුම් වර්ධන වේගයෙහි වැඩි වීමක් පෙන්නුම් කරමින් ගෝලීය සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය, 2019 ජූනි මාසයේ දී වාර්තා වූ 51.9 හි සිට 2019 ජූලි මාසයේදී 52.5 දක්වා ඉහළ යන ලදී.

ජපානය සහ චීනය යන රටවල සේවා අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක මගින් ද එම රටවල සේවා අංශ 2019 ජූනි මාසයට සාපේක්ෂව ජූලි මාසයේ දී වර්ධනය වූ බව පෙන්නුම් කරන ලදී.

*මූලාශ්‍රය: මාකිට්[1] ආයතනය, 2019 අගෝස්තු 15 වන දිනට*

***තාක්ෂණික සටහන:***

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.